පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

සතිය : සැප් : 2 වන සතිය

සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

ශ්‍රේණිය : 06

# ආදේශ භාණ්ඩ සැකසීම.


1 රූපය


2 රූපය


3 රූපය


4 රූපය

1 රූපයේ දැක්වෙන්නේ ටොනික් මූඩි යොදාගනිමින් සාදා ඇති ආදේශ භාණ්ඩයකි. එම ටොනික් මූඩි තලා හෝ නොතලා විවිධ හැඩ තලවලට අනුව ආදේශ පන්තේරු, ආදේශ ටැම්බරින් නිර්මාණය කළ හැකි වේ.

2 රූපයේ පරිදි මහත බෝතල් හෝ සිහින් ෆැන්ටා බෝතල් එක පෙළට ගැටගසා වතුර දමමින් විවිධ ස්වර වලට සුසිර කර නිර්මාණශීලී ආදේශ භාණ්ඩයක් සකසාගත හැකි ය. මෙම සබැඳියාවේ අත්තේ එවැනි ආදේශ භාණ්ඩයක් සකසා ගන්නා ආකාරයයි.
https://www.youtube.com/watch?v=zEumX2qBGUc

3 රූපයේ දැක්වෙන ආකාරයට මුං ඇට, සහල් ඇට , බොත්තම් , කඩල ඇට වැනි දෑ ප්ලාස්ටික් බෝතල්වලට යොදා මරකාස්, ශේකර් වැනි සංගීත භාණ්ඩවලට ආදේශකයක් ලෙස භාවිත කළ හැකිය.

4 වන රූපයේ දැක්වෙන්නේ PVC බට විවිධ ස්වර වලට සුසිර කර සාදාගත් ආදේශ භාණ්ඩයකි. මෙය වාදනය කරන්නේ රබර් සෙරෙප්පු දෙකක් මගිනි. මෙය වර්තමානයේ බටහිර රටවල ජනප්‍රිය ආදේශ සංගීත භාණ්ඩයක් වී හමාරය. මෙම සබැඳියාවේ අත්තේ එවැනි ආදේශ භාණ්ඩයකින් කරන වාදනයකි.
https://www.youtube.com/watch?v=wtChWZ6TeBQ

**“ඉහළ” හා “පහළ” යන වචන යොදා පහත වගුවේ ඇති හිස්තැන් සම්පූර්ණ කරන්න.**

| උපකරණය | | |
|---|---|---|
| ලෝහ කැබලි ග්ලොකන් ස්පීල් | දිග වැඩි නම් හඬ ................වේ | දිග අඩු නම් හඬ ................වේ |
| ෆැන්ටා බෝතල් නලා | වතුර වැඩි නම් හඬ.............. වේ | වතුර අඩු නම් හඬ.............. වේ |
| වතුර පුරවපු වීදුරුවලට තට්ටු කිරීම | වතුර වැඩි නම් හඬ.............. වේ | වතුර අඩු නම් හඬ.............. වේ |
| P.V.C. බටවලට තට්ටු කිරීම | දිග වැඩි නම් හඬ ................වේ | දිග අඩු නම් හඬ ................වේ |
| ප්ලැටිග්නම් පෑන් බට නලා | දිග වැඩි නම් හඬ ................වේ | දිග අඩු නම් හඬ ................වේ |